රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2019

මගේ අංකය: MPA/IAD/ADM/GA02/TWH/19
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.02.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>ත්‍රිපිටකය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම</u>**
**<u>(ශ්‍රී ත්‍රිපිටකාභිවන්දන සතිය 2019.03.16 සිට 2019.03.23 දක්වා)</u>**

ඉහත කරුණ සම්බන්ධව ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති අංක PS/PMD/C/06/2019 හා 2019.02.05 දිනැති චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. වසර දෙදහස් පන්සියයකට අධික කාලයක සිට වර්තමානය දක්වා ශ්‍රී ලාංකික භික්ෂු පරම්පරාවේ උත්කෘෂ්ඨ දායකත්වයද සහිතව සුරක්ෂිතව සම්ප්‍රේෂණය කරමින් සහ රාජ්‍යත්වයේ නොමසුරු අනුග්‍රහයෙන් රැකගෙන ආ නිර්මල ථෙරවාදි බුදුදහම ලෝකවාසී ජනතාවටත්, අනාගත පරපුරටත් නිවැරදි ලෙස ආරක්ෂා කොට දායාද කිරීමේ අරමුණ පෙරදැරිව, මහා සංඝරත්නයේ උපදෙස් හා මඟ පෙන්වීම අනුව ථෙරවාදී ත්‍රිපිටකය ජාතික උරුමයක් බවට නිල වශයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2019.01.05 දින ප්‍රකාශයට පත්කරන ලදී.

03. එහි දිගුවක් ලෙස මහා සංඝරත්නයේ අනුශාසනා පරිදි, ථෙරවාදි බුදුදහමේ කේන්ද්‍රස්ථානය ලෙස ශ්‍රී ලංකාවට හිමි ප්‍රමුඛස්ථානයේ වගකීම ආවර්ජනය කරමින්, ථෙරවාදි ත්‍රිපිටකය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බවට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2019.01.13 වන දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද යෝජනාවට අනුමැතිය ලැබී ඇත.

04. ඒ අනුව, 2019.03.23 වන දින ශ්‍රී ලාංකික ත්‍රෛනිකායික නාහිමිවරුන්ගේ මූලාසනාරූඪත්වයෙන්, සෙසු ස්වාමීන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් සහ ථෙරවාදි බුදුදහම අදහන ලොව අන් රටවල නියෝජනයන්ද සහිතව, එම යෝජනාව සමස්ත ථෙරවාදි බෞද්ධ රටවල සාමුහික යෝජනාවක් ලෙස මහනුවර ශ්‍රී දළදා මාලිගා මහමළුවේදී ඉදිරිපත් කිරීමට නියමිතය.

05. ඒ අනුව මෙම ජාතික කර්තව්‍යය සාර්ථක කර ගැනීම සඳහා එකී සමාරම්භක පියවර සනිටුහන් කරමින් 2019.03.16 දින සිට 2019.03.23 දින දක්වා කාලය '**ශ්‍රී ත්‍රිපිටකාභිවන්දන සතිය**' ලෙස ප්‍රකාශයට පත් කර තිබේ.

06. ශ්‍රී ත්‍රිපිටකාභිවන්දන සතියට අදාල වැඩසටහන පහත දැක්වේ.

2019.03.16 -දීප ව්‍යාප්ත පිණ්ඩපාත දානමය වැඩසටහන

2019.03.17 -දීප ව්‍යාප්ත දහම් පාසල් වැඩසටහන

2019.03.18 - දීප ව්‍යාප්ත පාසල් හා පිරිවෙන් පදනම් කර ගත් වැඩසටහන

2019.03.19 -රාජ්‍ය නොවන අංශයේ ආයතන පදනම් කරගෙන සිදු කරන වැඩසටහන

2019.03.20 - පොහොය දින විහාරස්ථාන පදනම් කරගෙන සිදු කරන වැඩසටහන

2019.03.21 -ථෙරවාදී ත්‍රිපිටකය පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය හා ශාස්ත්‍රීය ග්‍රන්ථයක් පිළිගැන්වීම

2019.03.22 - සියළුම රාජ්‍ය ආයතනවල සිදු කරන වැඩසටහන

2019.03.23 - මහනුවර ශ්‍රී දළදා මාලිගා මහමළුවේදි ප්‍රධාන ජාතික උත්සවය

07. ඉහත සතිය තුළ ඔබ ආයතනයේ හා අනුබද්ධිත සියළුම ආයතනයන්හි පහත වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

I. ශ්‍රී ත්‍රිපිටකාභිවන්දන සතිය පැවැත්වෙන කාලය තුළ සියළුම ආයතන බෞද්ධ කොඩිවලින් සැරසීම.

II. රාජ්‍ය අංශයට අදාල 2019.03.22 දින බෞද්ධ ආගමික වැඩසටහන් සිදු කිරීම.

III. ධර්ම දේශනයක් පැවැත්වීම.

08. ත්‍රිපිටකය ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඉහත සඳහන් සියළුම කරුණු ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ක්‍රියාත්මක කරවීම ඔබගේ වගකීමක් බව පෙන්වා දීමට කැමැත්තෙමි.

ජේ.ජේ රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත - 01. ජනාධිපති ලේකම් / ජනාධිපති ලේකම් කාර්යාලය - ඔබේ අංක PS/PMD/C/06/2019 හා 2019.02.05 දිනැති චක්‍රලේඛය අනුව කරු.දැ.ගැ.ස